

# දෙවන පැරකුම්බා රජු ගේ දින චර්යාව

රජ කෙනෙකුට අයිති වැඩ කටයුතු කොතරම් බැරෑරුම් ලෙස සලකන ලද්දේදැයි කඳවුරු සිරිත නම් ග්‍රන්ථයෙන් හෙළිවේ. දෙවන පැරකුම්බා රජු පොළොන්නරුවේ (කඳවුරු) නුවර වාසය කරද්දී ගත කළ දින චර්යාව එහි විස්තර කෙරේ.

රජතුමා නිදි යහනින් නැගිටිය යුතු වන්නේ හිරු නැගීමට දෙපැයකට කලිනි. වර්තමාන වේලාවන් අනුව පැයකුත් විනාඩි දොළහක් ලෝකය පිළිබඳ ත්‍රිලකෂණය භාවනා කළ යුතුය. ඊළඟ විනාඩි හතළිස් හය ගත කළ යුත්තේ ඔහු උගත් ධර්ම පාඨ කට පාඩම් කිරීම සඳහාය. මේ වන විට හිරු උදාවී ඇත.

මේ අවස්ථාවේ පුරෝහිත බ්‍රාහ්මන තෙමේ ශුද්ධ කුස තණ හා මන්ත්‍ර ජලය පූරවන ලද සක් ගෙඩියක් රජුට ඉදිරිපත් කරයි. ඔහු ඉෂ්ට මන්ත්‍ර හඬ නගා කියද්දී රජතුමා මේ දැ ස්පර්ශ කරයි. බ්‍රාහ්මණ තෙමේ රජු දුටු සිහින ගැන අසා සිහින අනිෂ්ට නම් කළ යුතු නිවාරණ කර්ම ගැන උපදෙස් දෙයි. පුරෝහිතවරයා ගියපසු රාජ වෛද්‍යවරයා රජු හමුවීමට පැමිණ මහ රජතුමාගේ ශරීර සෞඛ්‍යය ගැන විමසා අවශ්‍ය වෙදකම් ගැන උපදෙස් දෙයි. ඊළඟට රජතුමා මහ දෙරණා නම් නිලධාරීයා විසින් දෙනලද සුවඳ ජලයෙන් මුව දෙවීම් ආදී වූ ශරීර කෘත්‍යයන්හි යෙදෙති.

ඉන්පසු රජතුමා ජීවමාන බුදුන් වහන්සේ දකින්නට යන්නාක් වැනි ගෞරව භක්තියෙන් දළදා මැඳුරේ උඩු මහලට නැඟ හිසකෙස් හා රන්කෙඳි එක්කොට තනන ලද ඉලපතකින් සිද්ධස්ථානය අමදියි. දන්ත ධාතූන් වහන්සේට සොළොස් වර්ගයක පූද පූජා පවත්වයි. පූජා කරන හැම මලකටම සුවඳ පැන් ඉසියි. දන්ත ධාතූන් වහන්සේ ඉදිරියේ දණ ගසා සිල් සමාදන් වී තමන්ට පිරිනමන ලද පිරිත් පැන් භාරගෙන ගිතෙල් බඳුනක පිළිඹිබු වී පෙනෙන තම මුහුණ දෙස බලයි. හෙතෙම මේ ගිතෙල් බ්‍රාහ්මණයන්ට පිරිනමයි.

අනතුරුව රජතෙම දළදා මැඳුරේ පහත මාලයට බැස සිත්තරෙකු අල්ලාගෙන සිටින සායම් බඳුනකට තෙල් කූරක් ඔබා බුද්ධ රූපයක නේත්‍ර තබයි. ඉන්පසුව ඔහු බණ ඇසීමෙන් පසු දළදා මැඳුර ඉදිරියේ ඇති මණ්ඩපයට යයි. එහිදී භිකෂූන් වහන්සේට විවිධාකාර දානමාන ලබාදෙයි. පුරෝහිත විසින් ඉදිරිපත් කරන ලද මංගල අෂ්ඨක පිළිගෙන රෝගීන්ට බෙහෙත්, ගර්භනී ස්ත්‍රීන්ට දොළදුක් සඳහාද, බාලයන්ට රසකැවිලිද, මහල්ලන්ට තෙල් බෙහෙත්ද බලු කපුටු සත්වයන්ට සුදුසු ආහාරද බෙදා දෙයි. හෙතෙම පැයකුත් විනාඩි දොළහක් ආගමික හා සත්ව කරුණාව පිළිබඳ කටයුතු සඳහා ගතකොට මාළිගයට පෙරළා ආ විට වෛද්‍යවරයාද මාළිගයෙහි මුළුතැන් ගෙය භාර ප්‍රධානියාද, උදැසන භෝජනය මහ රජතුමන්ට පිළිගන්වයි.

ආහාරයෙන් පසු රජතුමා ඇඳ පැළඳ සැරසීමට කැටපත්ගෙට යයි. සතියේ එක් එක් දින සඳහා භාවිතා කෙරෙන සළු පිළි, ආභරණ හා මල් යන මේවායේ වර්ණය විවිධ වේ. දවසට සුදුසු අභරණ ඇඳ පැළඳ සැරසුණු රජතුමා කඩුව එක් අතකින්ද යෂ්ටිය අනික් අතින්ද දරා සුදු පියවිලි මතින් සිංහාසන ගබඩාවට සැපැත්ව දාන ශාලාවේ වාර්තා කියවන ලෙස අණ කිරීමෙන් දවසේ වැඩකටයුතු ආරම්භ කරයි. ඊළඟට භාණ්ඩාගාරයේ වාර්තා ඉදිරිපත් කෙරෙයි.

දැන් හිරු උදාවී සත් පැය හමාරක් ගතවී ඇත. පෙරවරු නමයට රජු මහානුභාවයෙන් සිංහසනාරූඪ වෙයි. මෙවිට රාජ්‍යමාත්‍යවරු රජු බැහැ දැක තම තමන් භාරයේ පවත්නා කටයුතු ගැන වාර්තා කරයි. මෙහිදී රජතුමා තමන් වෙත ඉදිරිපත් කරන ලද කරුණු ගැන නියෝග දෙයි. මේ අයුරින් පැයක් ගත කරන එතුමා තම අසුනින් නැගිට අවි සරඹ පුහුණුව සඳහා පිටත්ව යයි. දැන් දවසේ දොළොස් වැනි පැයයි. මෙවිට ප්‍රධාන දෛවඥයා රජු බැහැ දැක දවසේ ප්‍රධාන භෝජනයට සුදුසු සුබ මොහොත දන්වයි. මහවෙදනාද හා මුලුතැන් ගෙයි ප්‍රධානියාද යළි පැමිණෙති. මහරජතුමන් සඳහා පිළියෙළ කරන ලද ප්‍රණීත ආහාර වර්ග එතුමන් ආහාරයට ගැනීමට පෙර දිනපතා රජ මැඳුරේදී දන් වළඳන භිකෂූන් සියක් නමකට පිරිනමනු ලැබේ. ඉන්පසු රාජ වෛද්‍යවරයාගේ උපදෙස් අනුව රජතුමා තම ආහාරය ලබා ගනියි. මෙවිට පාවාඩ බත් ලබන දහස් දෙනකුටද ඇතුළු මාළිගාවේ සේවකයන් තුන්සිය දෙනකුටද සංග්‍රහ කරනු ලැබේ. රජතුමා මේ නිමවා අසුනෙන් නැගිට සළු පිළි මාරු කොට යටත් පිරිසෙයින් පියවර සියයක් සක්මන් කොට බූලත් වළඳා රාව තුළ නම් යහනට ගොස් සැතපෙයි. එවිට බ්‍රාහ්මණ කාන්තාවෝ පැමිණ රජුගේ හිසකෙස් පීරා නිය ඔපලති. සේවකයෝ පවන් සලමින් පා පිරිමදිති. තවත් සේවක පිරිසක් යහන් ගැබ මුර කරති.

මෙලෙස විවේක සුව විඳිමින් පැයක් ගත කරන රජතුමා ඉන් අනතුරුව සිංගාර මණ්ඩප නම් මඩුවට පිවිස කෝකිල හෙරවිලි යහන නම් යහන මත ඉඳ ගනියි. දාවල් මුරපුර නම් නිලධාරීහු මෙතැනට කැඳවනු ලැබෙත්. ඔවුහු පැයක් විනෝ දය සපයති.
රජතුමා මෙතැනින් රජ මැඳුරේ තට්ටුවට ගොස් එහි අතුරණ ලද රන් පළසක් මත හිඳගෙන රැගුම් බලයි. පස්වරු තුනට රජතුමා දවසේ දෙවැනි වරටත් රජ දැක්ම සඳහා හිඳ ගනියි. ප්‍රධාන නිලධාරීහු ඔහු පිරිවරා සිටිති. මෙහිදී විවිධ නිලධාරීන් විසින් ඉදිරිපත් කරන වාර්තාවලට සවන් දෙන රජතුමා තම අනුමැතිය හෝ අප්‍රසාදය පළකොට තම තීරණ දැනුම් දෙයි.

රාජ සභාවේ කටයුතුවලින් පසු රජතුමා දර්ශන මණ්ඩපයට ගොස් මඟුල් ඇතු හා මඟුල් අසු තමන් වෙත ගෙන්වා පශු වෛද්‍යවරයාගේ උපදෙස් පරිදි ඔවුන්ට ආහාර දී ඇත් අස් පන්ති භාර නිලධාරීන්ගේ වාර්තාවලට සවන් දෙයි. හිරු උදාවෙන් එකළොස් පැයක් ගතවන තෙක් රජතුමා මෙහි නැවතී සිට මාළිගාවේ සඳලු තලයට ගොස් ස්නානය කොට සළු පිළි මාරුකොට මල්දම් පැළඳගෙන දොළොස් පැයක් ගත වන තෙක්ම බුදුන් වැඳ බුදුගුණ අටකුරා සියස් විස්තර කෙරෙන ගාථා කට පාඩමෙන් හඬ නඟා කියා ආලන්තිමණ්ඩපයට ගොස් එහි දොරකඩ සිට ගනියි. එවිට සන්ධ්‍යා තූර්ය වාදන පැවැත්වේ. ස්ත්‍රීහු එක්දාස් අටසියයක් පමණ ආලන්තිබැමේ නිරත වෙති.

සන්ධ්‍යාවෙන් පැයකට පසු රජතුමා නාටක ශාලාවට පිවිස එහි සිහසුන මත වැඩ සිට නැටුම් ගැයුම් වැයුම් නරඹා ඔවුනට මල් කළඹ ආදිය පිරිනැමීමෙන් තම ප්‍රසාදය පළකොට සන්ධ්‍යාවෙන් පස් පැයක් ගත වූ පසු දෛවඥයා විමසා බොජුන් ගෙට පිවිස මේ නිමවා සක්මන් කොට නව අරහාදි බුදුගුණ මෙනෙහි කොට බූලත් වළඳා බිසෝ ගබඩාවට පිවිස එහි දෙපැයක් ගත කරයි. බිසෝ ගබඩාවෙන් පැමිණි පසු සරඹයෙහි යෙදී මාළිගාව මුර කිරීම් පිළිබඳ වැඩපිළිවෙළ ගැන පරීකෂා කොට හිරු උදාවෙන් අටළොස් පැයකට පසු යහන් ගබඩාවට පිවිස සිවු පැයක් සැතපේ.

ඉන්ද්‍රානි වසන්තා කුමාරි
දිවයින අනුග්‍රහයෙනි

